SJSD 2022 2(2): 10 - 17

**SRI LANKA JOURNAL OF SOCIAL DEVELOPEMENT** (SJSD)
**Volume 02 – Issue 02**

# අවදානමට ලක්විය හැකි කණ්ඩායම සඳහා සමාජීය වශයෙන් මැදිහත්වීම

**කලපිටියේ අරියවංස හිමි.**[1],
[1] Sri Lanka International Buddhist Acadamy

## සංක්ෂේපය

මෙම අධ්‍යයනයේදී සමාජයේ විවිධවූ හේතු නිසා අපචාරවලට ලක්වුවන දරුවන් පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමයි. පවතින සමාජය තුළ විවිධ පීඩාවන් සඳහා ලක්වූවන්ට එම සමාජයෙහිම සාමාජික, ආර්ථික සහ දේශපාලනික වශයෙන් විවිධ සමාජීය හේතු බලපාන ආකාරය ද මෙහිදී පැහැදිලි කෙරේ. මේ අනුව ළමා අපචාර පිළිබඳ විධිමත් අධ්‍යයනයක් සිදු කරණ අතර, ඒ පිළිබඳ නිගමනයක් සිදු කිරීම ද මෙම විග්‍රහයේ අරමුණ වේ.

දැනට පවතින සමාජ තුළ ළමා අපචාර ඇතිවීමේදී ඔවුන් තුළ කායික මානසික වශයෙන් ඇතිවන ගැටළු පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කෙරේ. මේ පීඩාවන් නිසාම අවදානමට ලක්වන දරුවන් පිළිබඳව සොයා බලා ඔවුන් වෙනුවෙන් කළයුතු යුතුකම් මෙන්ම වගකීම් පිළබදව අවදානය යොමු කිරීම ද මෙහිදී විශේෂයෙන් සාකච්ඡා කෙරේ. මේ හේතුව නිසා බිඳ වැටෙන පවුල් සහ මං මුලාවූ දරුවන් පිළිබඳ තොරතුරු සොයා ගනීමට හැකියාවක් ලැබේ. මෙම තත්ත්වයන් නිසා සමාජ ව්‍යසනයක් බවට පත්ව ඇති බාල අපචාරයන් වළක්වා ගැනීම සඳහා වගකිය යුත්තන්ගේ  අවදානයට ලක්කිරීම ද බලාපොරොත්තුවේ. එබැවින් සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය සහ සිද්ධි අධ්‍යයනය යන ක්‍රමවේද යන පරීක්ෂණ ක්‍රමවේද දෙකම භාවිතා කිරීමට අපේක්ෂා කරමි.

මෙම අධ්‍යයනය තුළින් සමාජ පවතින ළමා අපචාර පිළිබඳ අවබෝධ කර ගැනීමට මග සැකසෙන අතර එයට ප්‍රධාන වශයෙන් බලපාන හේතු ද අවබෝධ කර ගැනීමට හැකි වේ. එසේම ළමා අපචාරවලට ලක්වූ මෙම දරුවන් හිතන පතන ආකාරය පිළිබදවද තොරතුරු මෙහිදී අධ්‍යයනය කර ගන්නට ද පිළිවන. තවද බාහිර සමාජය මේ පිළිබඳව අවදානය යොමු කරන ආකාරය ද අවබෝධකර ගන්නට හැකිවේ.

**මුඛ්‍ය පද - ළමයා, සමාජය, අපචාර**

## හැඳින්වීම

සමාජ පිළිබඳව විමසා බැලීමේ දී එහි විවිධ කණ්ඩායම් දක්නට ඇත. එම කණ්ඩායම් විසින් වෙන වෙනම සිය වගකීම් තමන් ජීවත්වන සමාජයට ඉටු කරනු ලබයි. මෙම සමාජ කණ්ඩායම් හඳුන්වනු ලබන්නේ පුද්ගල එකතුවක් වශයෙනි. පවුල සමාජයේ කුඩාම ඒකකය වන අතර එම පවුල් ඒකක තුළින් නැවත දක්නට ලැබෙනුයේ ද පුද්ගල එකතුවකි. එසේ නම් සමාජ ගොඩ නැගෙන්නේ පවුල් එකතුවීම තුළින් බව අපට අවබෝධ කරගන්නට පිළිවන. එබැවින් සෑම සමාජයක්ම පවත්වාගෙනයාමේදී ආර්ථික සාමාජික දේශපාලනික තත්ත්වයන් අනුව විවිධ වෙනස් දක්නට ඇත. ඒ කෙසේ නමුත් සෑම සාමාජිකයෙකුට තමන් ජීවත්වන සමාජය තුළ විවිධ තත්ත්වයන් ඇත. එම තත්ත්වයන්ට අනුව දෙමාපියන්, දරුවන්, සහෝදර සහෝදරියන් ආදි වශයෙන් සමාජ සම්බන්ධතා ගොඩ නැගේ. එපමණක් ද නොව සමාජය තුළ ආගම, කුලය වැනි සමාජ සාධක මත සාමාජිකයන්ගේ ඇවතුම් පැවතුම් පවා වෙනස්වන අවස්ථාද දක්නට ඇත. විවිධ රටවලට අනුව ද විවිධවූ සමාජ, සංස්කෘතික සහ සිරිත් විරිත් ආදියෙහි වෙනස්කම් දක්නට ඇත. මේ අනුව දකුණු ආසියාතික සමාජ තුළ විවිධවූ සමාජ ලක්ෂණ ද ගොඩ නැගේ. සමාජ කාර්යයන් සහ සිරිත් විරිත් වැනි පොදු කටයුතුවලදී ද ඒ සියල්ල සිදු වන්නේ ඔවුනොවුන් පිළිගත් සංස්කෘතිය සහ සාරධර්මවලට අනුකූලවය.

තවද පවුල් තුළ විෂමවූ ගැටුකාරී තත්ත්වයන් ඇති වන අවස්ථාද දක්නට ඇත. මෙවැනි හේතු නිසා බොහෝ විට පීඩාවට පත්වන්නේ දරුවන් ය. මොවුහු විවිධ වූ කායික මානසික පීඩාවන්ට පත්වන අවස්ථා බොහෝමයක් දක්නට ලැබේ. එසේම විවිධ පීඩාවන්ට ලක්වන දරුවන්ට කිසිවෙකුගේ ආරක්ෂාවක් හෝ  ආවරණයක් ඇති නොවන නිසා එම තත්ත්වය ළමා අපචාර දක්වාම එය ගොඩනැගී ඇත. තවද කරණ ලද අධ්‍යයන තුළින් ද ළමා අපචාර වර්ධනයවීමට දරුවන්හට ආරක්ෂාවක් නොමැතිවීමක් එක් හේතුවක් බව තහවුරු වී ඇත. එබවින් මේ වනවිට මෙම ළමා අපචාර සමාජ ව්‍යසනයක් බවට පත්ව ඇත. එය වළක්වා ගැනීම වෙනුවෙන් විවිධ වූ නීති පද්ධති ගොඩනගා එය ක්‍රමවත්ව ක්‍රියාත්මක වෙමින් පවතී.

## ආර්ථික වශයෙන් පිරිහීම

මෙහිදී බාල අපචාර ඇතිවීමට ප්‍රධාන වශයෙන් බලපාන කරුණු පිළිබඳව පළමුවෙන්ම අවබෝධය ලබා ගතයුතුව ඇත. මෙයට මූලික හේතුව සොයා ගැනීම් තුළින් ගැටළුව මග හරවා ගැනීමට අවස්ථාව සැලසේ. දැනට ලෝකයේ පවතින සමාජයන් දෙස බැලීමේදී අන්‍යෝන්‍ය අවබෝධය ඇති වන්නේ ද ආර්ථික වශයෙන් මෙන්ම සමාජීය වශයෙන් ද දියුණු සමාජයක් තුළය. එම සමාජය තුළ ජීවත්වන ජනතාව විසින් ජීවිතය සමාජ පරිසරයට ගැලපෙන ආකාරයට සකස් කරගනිමින් භෞතික මෙන්ම ආධ්‍යාත්මික වශයෙන් ද සිය මානසික තත්ත්වයන් දියුණු කරගෙන කටයුතු කරණු ලබයි. එසේම නොදියුණු සමාජයක් තුළ ජීවත්වන ජනතාවට තම ජීවන ක්‍රියාවලිය පවා නිවැරදිව කළමනාකරණය කර ගන්නට පුරුදුවී නොමැත. ලංකාවේ ජීවත්වන ජනතාව එම සමාජය තුළ තමන්ගේ දක්ෂතාවය අනුව ජීවන ගමනේ ඉදිරියට යෑමට මග සැලසී ඇත. එයට හේතු වනුයේ ඉහළ තාක්ෂණ දැනුමක් අද ලෝකය තුළම තිබීම සහ බොහෝ පිරිසක් එම තත්ත්වයන්ට අනුගතව කටයුතු කිරීමය. නමුත් ලංකාවේ ජනතාව අතර සැලකිය යුතු කොටසක් අළුත් තාක්ෂණය නිවැරදිව අවබෝධ කර ගැනීමට උත්සහ දරා නොමැත. ලෝකයේ දැනට පවතින අලුත් තාක්ෂණය සමග එක් නොවීමද ගෝලීය ආර්ථික රටවේ මන්දගාමීවීමට බලපාන සාධකයකි. එබැවින් එය ආර්ථික වශයෙන් පිරිහීමට ද හේතුවක් විය හැකිය. එබැවින් මෙම පුද්ගලයන් ජීවත්වන සමාජය තුළ විවිධ ආර්ථික ගැටලු මෙන්ම සමාජ ගැටලු ඇතිවී තිබේ. මෙවැනි හේතු නිසා එම සමාජයන් තුළ ජීවත්වන දරුවන් ද සිය

අවශ්‍යතා වෙනුවෙන් විවිධ සමාජ විරෝධී ක්‍රියාවන් සිදු කරනු ලබන බව දක්නට ඇත. මෙම දරුවන් සිදු කරන ක්‍රියාකාරකම් බාල අපචාර වශයෙන් සඳහන් වේ. ඒවා කොටස් කීපයක් අනුව සොයා බලා නිරීක්ෂණ කිරීමට ද පිළිවන. ඒ අනුව

- ශාරිරික අපයෝජන
- ලිංගික අපයෝජන
- මානසික අපයෝජන
- නොසලකා හැරීම ආදිය මෙහිදී දැක්විය හැකිය.

## ළමා අපචාර හඳුනගැනීමට භාවිත පරිකෂණ ක්‍රම වේදයන්

ළමා අපචාර පිළිබඳව අධ්‍යයනය කිරීමේදී විශේෂවූ පරීක්ෂණ ක්‍රමවේදයන් භාවිත කළ යුතුව ඇත. එසේ නොවන්නේ නම් නිවැරදි දත්ත සොයා ගැනීමට හැකියාවක් සැකසෙන්නේ නැත. අද පවතින විවිධ මාධ්‍ය ද මෙම අපචාර වැඩිවීමට යම් තරමක් දායකත්වයක් ලබාදෙමින් පවතී. විවිධවූ බාල අපචාර පිළිබඳ තොරතුරු නිතර ප්‍රචාරය කිරීම ද එම තත්ත්වයන් සමාජ ගතවීමට බලපා ඇත. තවද මෙවැනි ව්‍යසනයන්ට නීතිය ක්‍රියාත්මකවීමේ මන්දගාමී බව ද ළමා අපචාර වර්ධනයවීමට තවත් හේතුවක් වී ඇති බවද පෙනේ. එබැවින් මේ පිළිබදව නිවැරදිව අධ්‍යයනය කර එම තත්ත්වයන් වලක්වා ගැනීමට මග සලස්වාදීමත් අවශ්‍යම සමාජ මෙහෙවරක් වන්නේය. මෙම අධ්‍යයනය තුළින් බලාපොරොත්තු වනුයේ බාල අපචාර පිළිබඳ යම් අකාරයකට හෝ නිවැරදි තොරතුරු සොයා බලා විශ්ලේෂණය සිදු කිරීමටයි. ඒ වෙනුවෙන් පරීක්ෂණ ක්‍රවේද දෙකක් පිළිබඳව අධ්‍යයනය සිදු කිරීමට බලාපොරොත්තු වේ. මේ අනුව සම්මුඛ සාකච්ඡා සහ සිද්ධි අධ්‍යයනය යන පරීක්ෂණ ක්‍රමවේද දෙකම භාවිතා කිරීමට මෙහිදී බලාපොරොත්තු වේ. මෙහිදී වැඩි අවධානයක් යොමු කරණුයේ සිද්ධි අධ්‍යයනයට ය.

මෙහිදී සම්මුඛ සාකච්ඡා සඳහා ප්‍රශ්නාවලියක් සකස් කර ඒ අනුව තොරතුරු රැස් කිරීමට කරනු ලබයි. තෝරා ගත් නියදිය තුළින් තොරතුරු රැස් කර ඒවා විශ්ලේෂණය කිරීම තුළින් ළමා අපචාර පිළිබඳ නිවැදරදි තොරුතුරු අවබෝධ කර ගැනීමට ද පිළිවන. මෙහිදී ද රැස්කරන ලද තොරතුරු විශ්ලේෂණය කිරීම තුළින් ද යම් වූ නිවැරදි දත්ත හඳුනා ගැනීමට පිළිවන.

සිද්ධි අධ්‍යයන පරීක්ෂණ ක්‍රමයද විශේෂ වශයෙන් මෙහිදී අවදානයක් යොමු කර ඇත. එයට හේතුව වනුයේ බාල අපචාර පිළිබඳ තොරතුරු මාධ්‍ය හරහා ප්‍රසිද්ධියට පත් කිරීම නිසා බොහෝ තොරතුරු පිළිබදව ජනතාව දැනුවත්ව තිබීමයි. ඒ අනුව පහත සඳහන් ජනමාධ්‍යයේ පළවූ විවිධවූ බාළ අපචාර සිද්ධි කීපය පිළිබඳව තොරතොරු ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි. ඒ අනුව මේ තුළින් යම් අවබෝධයක් ලබා ගැනීම සඳහා ජනතාවට හැකියාව ද ලැබේ.

1984 වර්ෂයේ අප්‍රේල් මස 28 දිනමිණ පුවත් පතේ පළවූ වාර්තාවක් අනුව ''සමන් කුමාර'' නැමැති සිසුවෙක් තම පාසල් වාරය අවසාන දිනයේ තම පවුලට සමීප ධර්මසිරි සහ ප්‍රේමරත්න නැමැත්තන් විසින් පැහැර ගෙන ගොස් කප්පම් ඉල්ලා ගෙල සිරකර මරා දැමූ පුවතක් වාර්තාවී තිබුණි. මේ පිළිබඳ පරීක්ෂණ අරඹා වැරදි කරුවන් එල්ලා මැරීමට නියෝග ලැබුණි. නමුත් ලංකාවේ මරණ දණ්ඩනය ක්‍රියත්මක නොවන නිසා ඔවුහු ජීවිතාන්තය දක්වා සිරගත කෙරිනි. නමුත් සිරිගෙය තුළ යහපත් කල් ක්‍රියාවෙන් කටයුතු කළ බව සඳහන් වේ.

මෑත කාලයේ සිදුවූ තවත් ම්ලේච්ඡ ඝාතනයකි 'සේයා සදෙව්මිණි' ඝාතනය. මේ සිදුවීම වෙනුවෙන් කොණ්ඩයා නැමැති අයෙකු අත්අඩංගුවට ගෙන පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව ඔහු නිර්දෝෂී විය. ඉන්පසුව පාසල් සිසුවෙක් අත් අඩංගුවට ගෙන ඔහු ද විවිධ චෝදනා එල්ල කරමින් ඔහු ද කායික මානසික පීඩාවට පත්කර වන්නට යෙදින. එසේම සිය පවුලේ පිරිස් පවා මේ හේතුව නිසා සමාජයේ පිළිකුල් කරන පිරිසක් බවට පත් කෙරිනි. මෙ සිද්ධිය ප්‍රචාරව කිරීම වෙනුවෙන ප්‍රසිද්ධ මාධ්‍ය වගකීමෙන් තොරව දැවැන්ත කාර්ය භාරයක් සිදු කළ අතර මේ හේතුව නිසා එම සිසුවා දැඩි ලෙස මානසික අපයෝජනයට ලක්විය.

එසේම යාපනයේ පුන්ගුඩුතිව් ප්‍රදේශයේ ''විද්‍යා'' නැමැති සිසු දියණියගේ ඝාතනය ද තවත් සමාජ අපචාරයට උදාහණයකි. ඇය පාසල් ගොස් නැවත නොපැමිණීම පිළිබද සොයා බැලීමේදී ඇය දූෂණය කර මරා දමා තිබූ බව දැන ගන්නට ලැබිණ. මේ පිළිබඳ සොයා බලා වැරදි කරුවන්ට දඬුවන් ලබාදීමට කටයුතු කරමින් යනු ලබයි.

2016 සැප්තැම්බර් 06 දින දිනමිණ පුවත් පතේ වාර්තාවූ ආකාරයට කුඩම්මා විසින් කුඩා දරුවකු උණවතුර දමා පිළිස්සූ පුවතක් වාර්තා වී ඇත. ''කුඩම්මා උනුවතුරෙන් පුච්චලා'' යනුවෙන් එම පුවත්පතේ ප්‍රධාන මාතෘකාව සටහන් කර තිබුණි. එම දරුවාගේ දෙමාපියන් දික්කසාදවීමෙන් පසු වෙනත් කසාදයක් කරගෙන ඇත. එම පියා නැවත විවාහවීම නිසා පැමිණි කුඩම්මා මෙම දරුවා වෙනුවෙන් මේ අපයෝජන පිළිබඳ ඉතාම ප්‍රසිද්ධියක් ලබාදීමට ප්‍රධාන පෙළෙ පුවත් ආයතන මෙන්ම රූපවාහිනී අයතන සක්‍රීයව දායකත්වය ලබාදී තිබුණි. තම මාධ්‍ය ආයතනය මෙම ප්‍රවෘත්ති පළමුව විකාශන කළ ආයතනය බවට පත්වීම ඔවුනගේ අරමුණ බව දැක ගන්නට පිළිවන. එසේම එම අවස්ථාවන්හිදී විවිධවූ සමීප ඡායාරූප ඉදරිපත් කරමින් තම මාධ්‍ය ජයග්‍රණය කළ ආකාරයක් මෙම ඉදිරිපත් කිරීම මෙවැනි වගකීමෙන් තොර කටයුතු කිරීම එතරම් යහපත් නොවන බව ද සඳහන් කළ යුතුය.

2016 ජූනි මස 25 දින දිවයින පුවත් පතේ ''හැන්ද රත්කර දස හැවිරිදි දරුවා පිළිස්සූ තරුණයා අත් අඩංගුවට'' යනුවෙන් ළමා අපචාර පිළිබඳ පුවත් පත වාර්තා කර තිබුණි. මෙහිදී මාධ්‍ය වාර්තා කරණ ලද ප්‍රවෘත්තිය යම් ආකාරයක සංයමයකින් යුතුව ඉදිරිපත් කර ඇත. එම දූෂණයට ලක්වූ දරුවාට කායික මානසික පීඩාවක් නොවන පරිදි මෙම ප්‍රවෘත්ති වාර්තාව ඉදිරිපත් කර ඇත.

2016 වර්ෂයේ අප්‍රේල් මස 25 දිනයේ ලංකාදීප පුවත් පතෙහි ළමා අපචාරයක් පිළිබඳව වාර්තාවක් සඳහන් වී තිබුණි. එහි ''පොදු සමාවෙන් නිදහස්ව පැමිණි, ස්ත්‍රී දූෂක පියා රැයක් පහන්වනතුරු තරුණ දියණිය දූෂණය කරයි'' යනුවෙනි. මෙහිදී මෙම දූෂකයා දිගු කලක් විවිධවූ ස්ත්‍රී දූෂණ සඳහා සම්බන්ධවූ අයෙකි. ඔහු වරෙක සිරභාරයට පත්ව බන්ධනාගාර ගතව සිට පොදු සමාව යටතේ නිදහස් වූ අයෙකි. එම නිදහස ලැබූ ඔහු නැවත වරක් සිය දූෂිත මානසික තත්ත්වය අනුව කාන්තා අපචාර සඳහා යොමුවී තිබුණි.

**මෙම ගැටළු සඳහා සමාජ ආරක්ෂණය**

මතු කරණු අනුව ළමා අපචාර අද සමාජයේ තීරණාත්මක ගැටලුවක් බවට පත්ව ඇත. මෙම තත්ත්වය බලහත්කාරකම් කිරීම මත ද බාල වයස්කාර දරු දැරියන්ට අපචාර සිදු වූ ආකාරය සමාජ දත්ත අනුව වටහා ගැනීමට පිළිවන. අවිධිමත් සමාජය තුළ ජීවත්වෙන පවුල් අතර බාලවයස්කාර දරු දැරියන් දූෂණයට ලක්කිරීම පිළිබඳ විවිධ තොරතුරු මේ අනුව අනාවරණය වේ. එයට හේතුව මෙම දරුවන්ගේ අනාරක්ෂිත තත්ත්වයයි. එකම නිවසේ බොහෝ පිරිසක් එකට ජීවත්වීම, ආර්ථික දුෂ්කරතා නිසා දරුවන් පමණක් නිවසේ තනිකර දෙමාපියන් මෙන්ම වැඩිහිටියන් විවිධ වූ රැකියා සඳහා පිටත් වූ අවස්ථාවලදී

පිටස්තරයන් මෙන්ම සමීපතමයන් විසින් එම දරු දැරියන් බලහත්කාරයෙන් අපචාර සඳහා යොදවා ගෙන ඇත. එසේම හුදෙකලා මාර්ගත් තුළදී සැලසුම් සහගතව පැහැරගෙන ගොස් දූෂණය කර මරාදමා ඇති අවස්ථාද මෙහිදී දක්නට ඇත. එසේම කායික මානසික වද බන්ධනවලට ලක්කර ඇත. මෙවැනි අපචාරයන්ට ලක්වන කෙනා දූෂණය කරන තැනැත්තන්ගේ දැඩි තර්ජන නිසා බියපත් වූ බැවින් එකම අවස්ථාවේ කිහිප දෙනෙක් විසින් අතවරයට ලක්වූ දරුවන් ද ඇත. දරුවන් මෙම අපචාරවලට යොමුවීම හුදෙක් තනි සිද්දියක්ම පමණක් ලෙස සැලකිය නොහැක. එය බහුතරයක්ම එක්ව වඩාත්ම විධිමත්ව සැලසුම් කළ ඒවා ය. ඉතා ක්‍රමවත්ව සැලසුම් කළ මෙබඳු දූෂණවලට දරුවන් ගොදුරු වන්නේ තමන්ගේ සමීපතමයන් විසින් සමීප පරිසරයක් තුළකවීමත් විශේෂයකි.

තරගකාරී මාධ්‍ය රටාව තුළ සමාජයේ සිදුවන හානි පිළිබඳ ඔවුනට අවබෝධයක් නොමැති බව ඉදිරිපත් කරන ලද කරුණු අනුව තහවුරු වේ. විවිධ අපචාර සිද්ධීන් තම මාධ්‍යය තුළන් පළමුව විකාශනය කළ බව ප්‍රකාශ කිරීම මූලිකම බලාපොරොත්තුව වේ. එබැවින් එම සිදුවීම ඡායාරූප ගතකොට මාධ්‍යයට යොමු කිරීම තුළින්ම එම මාධ්‍යයන්හි අරමුණු මනාව අවබෝධ කර ගැනීමට හැකිවේ. දරුවන් කෙරෙහි අවදානය අඩුවීම නිසා ද දරුවන් විවිධ අපචාරවලට ගොදුරු වේ. තවද ආර්ථික දුෂ්කරතා ඇතිවීම ද දරුවන් මෙවැනි අකටයුතුකම් සඳහා යොමුවීමට තවත් කාරණයකි. පවතින සමාජයන් තුළ තම අභිමතය පරිදි ජීවත් වන්නට අවශ්‍ය නම් ආර්ථික වශයෙන් ද ශක්තිමත් විය යුතුය. බොහෝ විට තම අගහිගකම් තිබුණද අනිත් දරුවන් සමග සම සමව කටයුතු කරන්නට සෑම දරුවෝම කැමති වෙති. නමුත් පවතින ආර්ථික තත්ත්වය මත දෙමාපියන්ට සිය දරුවන් වෙනුවෙන් දැඩි කැප කිරීම් කරන්නට සිදුව ඇත. නමුත් දැනට පවතින සමාජ පැවැත්ම නිසා බොහෝ විට ඔවුහු බාහිර පාර්ෂව කරුවන් සමග සම්බන්ධ කම් ගොඩ නගා ගනිති. මේ කරුණු නිසාද දරුවන් අපයෝජන ලක්වූ අවස්ථා ද ඇත. අනෙක් කාරණය වනුයේ බොහෝ දරුවන් තම අවශ්‍යතා පිළිබඳව පමණක් සිතා කටයුතු කරන හෙයින් තම අභිමතය පරිදි කටයුතු කරන්නට යාම නිසා විවිධ හිංසනයන්ට ගොදුරුවීමයි.

ආර්ථික දුෂ්කරතා නිසා සමාජයේ ධනවත් යැයි සම්මත අය සමග සමීප සම්බන්ධතාවයක් ළමුන් විසින් ඇති කරගනු ලබයි. මෙහි දී විශේෂයෙන්ම දරුවන්ගේ අරමුණ වනුයේ තම ආර්ථිකය ශක්තිමත් කර ගැනීමවුවද ධනවතුන්ගේ මූලික අරමුණ තම ලිංගික අවශ්‍යතා ඉටුකරගැනීම ය. බොහෝ විට විවිධ වූ ආර්ථික අවශ්‍යතා නිසා සමහර දරුවන් මෙම ක්‍රියාවන් සඳහා සිය කැමැත්තෙන්ම ඉදිරිපත් වී ඇත. දෙමාපියන්ගෙන් නොලැබෙන ආර්ථික අවශ්‍යයතා අන් අය වෙතින් ලැබෙන විට ඔවුන් සමාජ විරෝධී ක්‍රියාවන් සඳහා සම්බන්ධ වී ඇත. යම් හෙයකින් මෙම දරුවන්ගේ ලිංගික ක්‍රියාකාරකම් සමාජයට විවෘත වූ අවස්ථාවලදී, නීතිමය කටයුතු පවත්වා ගෙන යනවිට එය සමූහ දූෂණයට ලක් වූ අවස්ථාවක් ලෙස නම් කරනු ලබයි. මේ අනුව ඒ සඳහා සම්බන්ධ වූ සියලූම දෙනා නීතියට කොටුකර දඬුවම් දීම සාමාන්‍ය ස්වභාවයයි.

නමුත් මෙම දරුවන්ගේ අවශ්‍යතා පිළිබඳ සොයා බැලීමට හෝ ඒ වෙනුවෙන් සහයෝගය ලබාදීමට කිසිවෙකුත් ඉදිරිපත් නොවීම සිය දරුවන්ගේ ජීවිතය විනාශය දක්වාම ගමන් කරන්නට මග සැලසී ඇති බව මේ අනුව අපට පැහැදිලි වේ. ළමයින්ට තමන්ගේ ජීවන අවස්ථා ශක්තිමත්ව සම්පූර්ණ කර ගන්නට අවශ්‍ය ආර්ථිකය ගොඩ නොනැගෙන බැවින් ඔවුන් ලිංගික ජීවිතයට හුරුවී එය වෘත්තියක් හැටියට පවත්වාගෙන යාමට පෙළඹේ. මේ සඳහා ලිංගික ජාවාරම් කරුවෝ ද මෙම දරුවන් සමඟ එක්ව තම ආර්ථිකය ද ශක්තිමත් කරගන්නට උත්සහ දරති. විවිධ අවස්ථාවල නීතිමය රැකවරණ ද මෙම නීති විරෝධී වැඩ සටහන සඳහා ලැබී ඇත. මතු සඳහන් කරුණු අනුව සැලකීමේදී මෙය සමාජයේ ගැටලුවක් දක්වාම වර්ධනය වී ඇති බව තේරුම් ගත යුතුව ඇත. යම් හෙයකින් දරුවන් වෙනුවෙන් ඉදිරිපත් වන්නට හෝ උපදෙස් දෙන්නට උපදේශක මට්ටමින් සිටින කෙනෙක් හෝ ආයතන

පැවතියේ නම් මෙම දරුවන් මෙවැනි කායික මානසික පීඩාවන්ට මෙන්ම ලිංගික අතවරයන්ට යොමු නොවන්නට තිබුණි. එබැවින් මෙම බාල වයස්කාර අපචාරයන්ට අවහිරකම් ඇති කරන වැඩසටහන් සංවිධානය කිරීම ඉතාම කාලෝචිත කාර්යයකි.

නීතිමය තත්ත්වය ගැන සැලකීමේ දී යම් රැකවරණයක් දරුවන් වෙනුවෙන් වෙන්ව ඇත. පළමුවෙන්ම දරුවන් වෙනුවෙන් උපදේශකයන් ඇත. මෙහිදී පොලිස් ළමා හා කාන්තා කාර්යංශය විශාල කාර්යභාරයක් සමාජය වෙනුවෙන් ඉටුකරයි. එපමණක් නොව සෑම පාසලකම දරුවන් වෙනුවෙන් උපදේශක ගුරුවරයෙක් ඇත. එම ගුරුවරයා උපදේශනය සඳහා පුහුණුවක් ලැබූ අයෙකි. එසේ ම ආගමික පරිසරය තුළ ද දරුවන්ගේ ජීවිතේ නිවැරදිව ගත කිරීමේ මාර්ග ගැන උපදෙස් ලැබෙනු ඇත. ඒ කෙසේ නමුත් මේ දරුවන් වෙනුවෙන් සිය අවශ්‍ය ආර්ථික සහන ලබාදීම සඳහා පුද්ගලයන් හෝ ආයතන ඉතාම අල්පය. ආර්ථික වශයෙන් මෙන්ම සමාජ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ද යම් වැඩපිළිවෙලක් සකස් කරදීම මෙම දරුවන් අභිවෘද්ධිය සඳහා මනා පිටුවහලකි. මේ සඳහා දෙමාපියන්ට මෙන්ම විවිධ සමාජ ක්‍රියාකාරීන්ට මෙන්න ආගමික නායකයින්ට ද පැවරෙන්නේ විශාල කාර්යභාරයකි. මෙය නිසි ලෙස සංවිධානය කිරීමට හැකියාවක් තිබේනම් මෙම බාලවයස්කාර දරුවන් ලිංගික අපයෝජනයන් ගෙන් ආරක්ෂා කරගන්නට අවස්ථාවන් ලැබේ.

## සුබ සාධන ක්‍රිකාරකම්

මතු පරීක්ෂණයන් අනුව අවබෝධ කරගත් සමාජ ගැටළුවලදී ඔවුන් එම තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා යම් උපකාරයක් පුද්ගලයන් වශයෙන් මෙන්ම සමාජ ක්‍රියාකාරීන් වශයෙන්ද අප විසින් සිදු කළ යුතුව ඇත. එය සමාජ ශුභ සාධන වැඩ සටහනකි. එසේ වුවහොත් යම් තරමකින් හෝ මතු සඳහන් කරන ලද සමාජ ව්‍යසනයන්ගෙන් ජනතාව ආරක්ෂා කරගැනීමට සුදුසු පරිසරයක් සැකසීම ද අපගේ වගකීම බවට පත්ව ඇත. මෙය සමාජ සුභසාධන ක්‍රියාවලියකි. මෙම සුබසාධන ක්‍රිකාරකම් ආර්ථික වශයෙන් මෙන්ම කායික මානසික වශයෙන්ද ලබාදීමට පිළිවන. තම අවශ්‍යතා ඉටු කර දීම සඳහා ආර්ථික ශක්තිය ලබාදීමට හැකි වන අතර, මානසික උපදේශනය ලබාදී මානසික සහනයක් ලබාදීම ඒ අතර ප්‍රධාන කාර්යයක් ලෙස සැලකිය හැකිය.

## මානව හිමිකම් ආරක්ෂා කිරීම

බාල අපචාර වැනි සමාජ ව්‍යසනවලදී එම තත්ත්වයෙන් පසුව එම පීඩනයට ලක්වූවන්ට සුබ සාධන වැඩ සටහන් සංවිධානය කිරීම වැදගත්වුවද එයට වඩා එම අපචාර වළක්වා ගැනීමට සැලසුම් සකස් කිරීම කාලෝචිත ක්‍රියාවකි. එසේම ස්ත්‍රී දූෂණයට අධිකරණයේදී වැරදිකාරයන් වෙනුවෙන් පිළිගත් නීතියට අනුව දඬුවම් ලබා දිය යුතුව ඇත. එසේ වන්නේ නම් එම දඬුවමට බිය නිසාත්, එම දඬුවමට විඳීමට තිබෙන අකමැත්ත නිසාත් කිසිවෙකු දූෂිත ක්‍රියාකාරකම් සඳහා ඉදිරිපත් නොවනු ඇත. කුඩා ළමුන්ගේ ද ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා ළමා අධිකාරියේ සාමාජිකයන් මෙන්ම නීතියේ ආධිපත්‍ය දරන වගකිව යුතු නිලධාරීන්ගේ ද සහයෝගය ඉතාම දක්ෂව ලැබේ. නමුත් ඒවා නිවැරදිව නීතියට අනුකූලව බොහෝ විට ක්‍රියාත්මක වන්නේ මන්දගාමීවය. නිවැරදිව ක්‍රියාත්මක වුවහොත් සමාජයේ පවතින ළමා අපචාර වැනි දූෂිත වැඩසටහන් ක්‍රමානුකූලව අඩුවී යහපත් සමාජයක් ගොඩ නැඟෙන්නට මග සලසා ගැනීමට පිළිවෙන. මෙහිදී ඒ වෙනුවෙන් සමාජ ක්‍රිකාරීන් පුහුණු කිරීම මෙන්ම මනෝ උපදේශක ආයතන සෑම ගමක් තුළම ස්ථාපිත කළ යුතු වේ. මේ වන විට සෑම ගමකම රාජ්‍ය නිලධාරීන් විවිධ කාර්යයන් සඳහා සිටියද මනෝ උපදේශනය සඳහා රාජ්‍ය නිලධාරීන් නැත. නමුත් මෙම උපදේශන ක්‍රියාවලිය ගමෙහි ද ඇති කළ යුත්තකි. මෙමගින් ජනතාවට මානසික සහනය සැලසෙන වැඩසටහන් සංවිධානය

කිරීමට ද පිළිවන. ළමා අපචාර සහ ළමා හිංසන ඇති වන්නේ ද අනවබෝධය නිසාය. මේ පිළිබඳව විශේෂයෙන්ම දෙමාපියන්ගේ මෙන්ම වැඩිහිටියන්ගේ ද අවධානය යොමු වියයුතු අත්‍යාවශ්‍යය කාරණයකි. කායික සහ මානසික වශයෙන් පීඩාවට පත්වූවන් වෙනුවෙන් වගකිය යුත්තන්ගේ අවධානය යොමු විය යුතුය. තමන්ගෙ සමීපතමයන් හැටියට දෙමාපියන් ගැන විශ්වාසය තබන දරුවන් ඔවුන්ගෙන් ආදරය කරුණාව බලාපොරොත්තු වේ. පවතින සමාජය තුළ දරුවන්ගේ අවශ්‍යතා ප්‍රායෝගික වශයෙන් දෙමාපියන් අවබෝධ කරගෙන නැති අවස්ථාද දැක ඇත. මෙම තත්ත්වය සමාජ ව්‍යසනය දක්වාම ගොඩනැගේ. එබැවින් මෙය වළක්වා ගැනීම සඳහා ප්‍රායෝගික වැඩ සටහන් සංවිධාන කිරීම දෙමාපියන් මෙන්ම දරුවන් වෙනුවෙන් වැඩ සටහන් පැවරී ඇති රාජ්‍ය නිලධාරීන්ගේ ද වගකීම වේ.

**සාරාංශය**

මෙහිදී අවධානයට ලක්වූයේ ''අවදානමට ලක්විය හැකි කණ්ඩායම සඳහා සමාජීය වශයෙන් මැදිහත්වීම'' පිළිබඳව කරුණු විස්තර කෙරිනි. ඉදිරිපත් කරන ලද ප්‍රශ්නාවලිය තෝරාගත් නියදියක් තුළ සිදු කළ බැවින් ඔවුනගේ අදහස් පිළිබඳ ද අවදානය යොමු කළ යුතුව ඇත. මෙහිදීද ළමා අපචාර පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට පිළිවන. බාල අපචාර වශයෙන් ලිංගික අපචාර ලෙස 65% පිළිගෙන තිබුණි. නමුත් ළමා අපචාර ගණයට තවත් බොහොමයක් ඇති බව සිද්ධි අධ්‍යයනය සිදු කිරීම ලබාගත් තොරතුරු අනුව දැන ගන්නට පිළිවන් විනි. ආර්ථික සාමාජික පිරිහීම නිසා ළමයින් විවිධ අපචාර වෙත යොමුවූ බව 10% පමණ පිරිසක් සඳහන් කර ඇත. නියදියට සම්බන්ධවූ අය අතරින් බාල අපචාර වර්ග පිළිබඳ නොදැනුවත් පිරිස 15% පමණ වේ. සිය කැමැත්තෙන්ම ලිංගිකව එක්ව කටයුතු කිරීමේ කැමැත්ත තෝරාගත් දරුවන්ගෙන් 10% ප්‍රකාශ කර ඇත.

සිද්ධි අධ්‍යයනයේදී මාධ්‍ය තුළින් ළමා අපචාර කිරීම පිළිබඳව අවධානය යොමු කර ඇත. වර්තමානයේ ළමා අපචාර පිළිබඳ පුවත්පත් විසින් විවිධ අවස්ථාවල සිදු කරන ලද වාර්තා කිරීම් පිළිබඳ කරුණු කීපයක් කෙරෙහි අවදානය යොමු කරන ලදී. පුවත් පත් මෙම අපචාර සිද්ධි පිළිබඳ වාර්තා කිරීමේදී කිසිම සංයමයකින් තොරව තොරතුරු ඉදිරිපත් පතකර ඇත. තමන්ගේ වගකීම් පිළිබඳ එම මාධ්‍ය ආයතන ද සලකා නැත. එම ආයතන ඉදිරිපත් කරන ලද පින්තූර මාධ්‍ය සදාචාරය පවා නොසලකා හැර ඉදිරපත් කර තිබුණි. මෙම මාධ්‍ය හරහා අපචාර පිළිබඳව ජනප්‍රිය කිරීම නිසා එහි වර්ධනයක් ද වී ඇති බව පොනේ. එබැවින් මෙම සමාජ ව්‍යසනය අවසන් කර ගැනීම සඳහා සක්‍රිය වැඩ සටහනක් සකස් කිරීම මෙහි අරමුණ වේ.

**ආශ්‍රත ගන්ථ**

දීඝ නිකාය - ප්‍රථම භාගය (1962) බු.ජ.ත්‍රි.ග්‍ර.මා. ලංකා ආණ්ඩුව මගින් ප්‍රාකාශිතයි.

මජ්ඣිම නිකායේ - ප්‍රථම භාගය (2006), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. ලංකා ආණ්ඩුව මගින් ප්‍රාකාශිතයි.

සංයුත්ත නිකායේ - ප්‍රථම භාගය (1960) ,බු.ජ.ත්‍රි.ග්‍ර.මා. ලංකා ආණ්ඩුව මගින් ප්‍රාකාශිතයි.

අංගුත්තර නිකාය- ප්‍රථම භාගය (1960), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. ලංකා ආණ්ඩුව මගින් ප්‍රාකාශිතයි.

Aṃguttara Nikaya (2005), pāli Edition,)

Aṃguttara Nikaya, Dhammapada (2005), pāli Edition,

Saṃyutta Nikaya Salatana vagga, (2005), pāli Edition,

පාලිත හිමි, මහරඹෑවේ, (2010), ගැටුම් නිරාකරණය, බුදුරජාණන් වහන්සේගේ එළඹුම් සහ නූතන එළඹුම්, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ,

සරත්චන්ද්‍ර, ඩබ්ලිව්.ඒ. (2000), සමාජ ප්‍රශ්න විමසුම, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

රාහුල හිමි, වල්පොල, (1997), බුදුන් වදාළ ධර්මය, 7 මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.

ඥාණතිලක හිමි, තිස්ස. (1979), මිනිස් ගැටළු පිළිබඳ බෞද්ධ විග්‍රහය, කොළඹ.

ධර්මසිරි, ගුණපාල, (1988), බෞද්ධ සදාචාරයේ මූලධර්ම, සර්වෝදයේ ග්‍රන්ථ ප්‍රකාශන සේවය, රත්මලාන.

විජේබණ්ඩාර, චන්දිම, (1989), බෞද්ධ සමාජ සංවර්ධනය බුදුසරණ වෙසක් පත්‍රය.

වික්‍රමසිංහ, මාටින්, (2008), ජාතක කථ විමසුම හයවන මුද්‍රණය, සී/ස. සරස (පෞද්ගලික) සමාගම. රාජගිරිය.

ප්‍රනාන්දු, එස්. දයා, (1984), බුදු සමයේ දේශපාලන චින්තනය , ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

අල්විස්, ලලනි, (2013), ළමා අපචාර පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්, සමාජ විද්‍යාපති උපාධි නිබන්ධනය, කැළණි විශ්වවිද්‍යාලය.

කුමාර, එස්, (2002), ළමා අයිතිවාසිකම්. කර්තෘ ප්‍රකාශන, මොරටුව.

කුලතිලක, බණ්ඩාර, (2006), ළමයා හා අපයෝජන, කර්තෘ ප්‍රකාශන, මහරගම.

කුරේ, නිරංජන්, (2001), ශ්‍රී ලංකාවේ සිදුවන ළමා අපයෝජන, පීස් ප්‍රකාශන, කොළඹ 04.

ද සිල්වා, හරේන්ද්‍ර, (2001), දරුවන් සමග වීඩියෝ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සඳහා උපදෙස්, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ශ්‍රී ජයවර්ධනපුර.

ප්‍රේමසිරි, එස්, (2006), ළමා අපයෝජන පිටුදකිමු, සමයවර්ධන ප්‍රකාශනයෝ, කොළඹ 10.

පතිරණ, බුද්ධිප්‍රභා, (2008), අපයෝජනයට ලක්වූ දරුවන් සුවපත් කිරීමට අතදෙමු, Save the Children කොළම 10.

Unicef, (2003), United Nation Convention on the Right of the Child (UNCRC), Colombo.

De Silva, Harendra, (2000), Child Abuse, National Protection Authority" Sri Lanka.